# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2294/67 - 2022 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2022.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් සභාව**

උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ විනෝද බදු පැනවීම

(267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ 2022.01.13 වන දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක (ඉ)(IV) යටතේ සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව ඉහත කී විනෝද බදු ආඥාපනතේ දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බවට එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2022 ජූලි මස 07 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව උඩදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පැවැත්වෙන විනෝද ප්‍රසංගවලට ඇතුළත්වීමේ දී ගෙවනු ලබන මුදල්වලින් විනෝද බද්දක් පනවා අයකර ගැනීමටත්, ඇතුළත්වීමේ ගාස්තුවෙන් 5% ක ප්‍රතිශතයක් පනවා අය කිරීමටත් යෝජනා කරමි.

EOG 08 - 0268

1A - PG 5948 — 11 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*